# 6 කතා බහට අවධානය




සවන් දීම දැනුම ලබා ගන්නා එක් මාර්ගයකි. 7 ශ්‍රේණියේ දී 'කතා බහට සංයමයක්' පාඩම මගින් ද පුද්ගල සංවාද කීපයක් ඉදිරිපත් කර ඇත. ගුරුතුමා හෝ ගුරුතුමිය හෝ කියා දෙන පාඩම මනා අවධානයෙන් යුතුව අසා නො සිටිය හොත් එය මතකයේ නො රැඳේ. නිවේදනයකට හෝ පණිවිඩයකට හෝ ප්‍රතිචාර දැක්විය යුත්තේ ද අවධානයෙන් යුතුව සවන් දීමෙනි.

එකිනෙකා අතර ඇති වන කතා බහේ දී හා සංවාදවල දී අවධානය මෙන් ම ආචාරශීලි වීම ද අවශ්‍ය ය. එදිනෙදා ජීවිතයේ දී අපට විවිධ අය සමග කතා බහ කරන්නට සිදු වේ. ඒ අතර අප හා සම වයසේ අය මෙන් ම වැඩිහිටියන්, පූජ්‍ය - පූජක පක්ෂය හා විවිධ ආයතනවල නිලධාරීන් ආදි විවිධ වයස් හා සමාජ මට්ටම්වලට අයත් පිරිස් සිටිය හැකි ය. මේ අය සමග කතා බහ කිරීමේ දී ඔවුන්ගේ වැඩිහිටිබවට, පූජනීයත්වයට, තනතුරට අදාළ වන සේ ආමන්ත්‍රණය හා ප්‍රතිචාර දැක්වීම කළ යුතු වෙයි. එයින් ආචාරශීලිභාවය පළ කරන්නා සේ ම සුහද සමාජ හා පුද්ගල සම්බන්ධතා ද වර්ධනය වෙයි.


නොමිලේ බෙදා හැරීම සඳහා ය.

කතා බහකට සවන් දී ආචාරශීලීව ප්‍රතිචාර දැක්වීමේ ගුණය අපේ ගැමි සමාජයේ මැනවින් පිළිබිඹු විය. පහත දැක්වෙන්නේ ගැමි සිසු දරුවකු හා ගුරුවරයකු අතර වන කතා බහකි.



"මුදලිහාමි, හෙට සවස ගෙදර වැඩක් මොකුත් තියෙනවා ද?"

"වැඩක් නං නෑ මහත්තයා"

"හෙට හවස මාත් එක්ක කැකිරාවට යන්න ලෑස්ති වෙලා එන්න පුළුවන් ද?"

"පුළුවන් මහත්තයා"

"එහෙනම් ඉස්කෝලෙ ඇරිලා මාත් එක්ක කැකිරාවට යනවයි කියලා ගෙදර අයට කියලා එන්න ඕනෑ."

"හොඳයි මහත්තයා"

"දැන් ඉන්අනිද්දානේ කොළඹ යන්නේ. එහෙ ගිහින් දුවන කොට මෙහෙදි වගේ සරම පිට පට ගහගෙන දුවන්න බෑ. මුදලිහාමිට මගේ ගානෙ කලිසමක් මස්සලා දෙනවා. හෙට ගිහින් මිම්ම දීලා එමු."

"හොඳමයි මහත්තයා"

"දැන් එහෙනම් ගෙදර යන්න."

- මීටර් සියය

ගම්බද පාසලකට අලුතෙන් පැමිණි ගුරුවරයකු දිවීමෙහි දක්ෂ සිසුවකු ක්‍රීඩා කටයුතුවලට උනන්දු කරවමින් උද්‍යෝගයෙන් හා කැප වීමෙන් කටයුතු කරන ආකාරයත් ඒ බැව් දන්නා සිසු දරුවා ගුරුතුමාගේ කතා බහට ආචාරශීලීව සවන් දෙමින් ප්‍රතිචාර දක්වන ආකාරයත් ඉහත සංවාදයේ පෙන්නුම් කෙරේ.

පහත දැක්වෙන්නේ රජයේ නිලධාරියකු හා ගැමි මවක අතර සංවාදයකි.



ඉතා යටහත් පහත්ව අපේ අම්මා දැත් එක්කොට වැඳ පෙත්සම පිළිගැන්නුවා ය.

"මොක ද මේක ඉංග්‍රීසියෙන් ලියලා තියෙන්නේ? බැරිද ඉංග්‍රීසියෙන් ම කියන්න."

"අනේ හාමුදුරුවනේ පෙත්සම් ලියන මහත්මයා කිව්වා ඉංග්‍රීසියෙන් ම ලීවොත් හොඳයි කියලා. අපි නූගත් මිනිස්සු. අපිට ඕවායේ හයක් හතරක් දැනෙන්නේ නැහැ. මේක නම් හරි ම ඇබැද්දියක් හාමුදුරුවනේ, තමුන්නාන්සේට බුදු බව අත්වෙයි අපිට සහනයක් කර දුන්නොත්" යයි අම්මා බැගෑපත්ව කීවා ය.

"කොහෙ ද ගම?"

ඒජන්ත උන්නාන්සේ මෙසේ අසමින් පෙත්සම දෙස ද බලා පෑන මේසය මත තබා මා දිහා බලන්න විය. මම ලේන්සුවෙන් නහය පිසදා ගතිමි. අපේ ඉස්කෝලේ සිකුරාදාට තියෙන මීටිමේ සෝමරත්නලාගේ නංගී කතන්දරයක් කියනවා වගේ අම්මා නොනවත්වා ම විස්තරේ කියාගෙන ගියා ය.

ඒජන්ත උන්නාන්සේ නිශ්ශබ්දව කන් දී සිටියේ ය. "අපිට වෙලා තියෙන්නෙ හරි ම කරදරයක්. හුංගා ඇනපු මිනිහා විතරයි හාමුදුරුවනේ ඒකෙ වේදනාව දන්නෙ. ඇස් ලොකු බණ්ඩා හිටපු විදානෙගෙන් තියෙන කරදර කියලා ඉවර කරන්න බැහැ."

"මොනව ද විදානෙගේ වැරදි?"

"නොයෙක් නරක වැඩ හාමුදුරුවනේ ඔය පෙත්සම් ඔක්කොම ලියලා තියෙනවා."

"ඒක ඇත්ත මම කැමති උඹලාගේ කටෙන් ම මේවා අහන්න."

**පෙත්සම** - ලීල් ගුණසේකර

ගැමි මවක තම දුක්ගැනවිල්ල ඒජන්තවරයා — වර්තමාන ව්‍යවහාරය අනුව දිස්ත්‍රික් ලේකම්වරයා හෝ ප්‍රාදේශීය ලේකම්වරයා — හමුවේ කියා ගෙන යයි. ඔහු රජයේ ඉහළ නිලධාරියකු වුව ද එම දුක්ගැනවිල්ලට සාවධානව සවන් දෙමින් ප්‍රතිචාර දක්වයි. එය උසස් ගුණාංගයකි.

පාසලේ දී හා ඉන් බැහැර රජයේ හා පෞද්ගලික ආයතනවල නිලධාරීන් හමු වී කතා බහ කිරීමට අපට නිතර සිදු වේ. එකිනෙකා හා කථා කිරීමේ දී ආවේගාත්මක නො වීම, අනවශ්‍ය තොරතුරුවලින් තොරව අවශ්‍ය කරුණු දැක්වීම, ප්‍රියශීලීභාවය, ආචාර සම්පන්නව හැසිරීම, සංයමය ආදි ගුණාංග අන්තර්පුද්ගල සම්බන්ධතා දියුණු කිරීමට හේතු වෙයි.

දසුන් ශානක වැලිගලතැන්න ක්‍රීඩා සමාජයේ ලේකම්වරයා ය. තම ක්‍රීඩා සමාජයේ වාර්ෂික ත්‍යාග හා සහතික පත්‍ර ප්‍රදානෝත්සවයට පැමිණෙන ලෙස ප්‍රාදේශීය ලේකම්වරයාට ආරාධනා කිරීම සඳහා ඔහු ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට යයි. නිල කාමරයට පැමිණෙන ලෙස දැනුම්දීමෙන් පසුව ඔහු ආරාධනා පත්‍ර ද රැගෙන එහි ඇතුළු වෙයි.

| | |
|---|---|
| ප්‍රාදේශීය ලේකම්: | එන්න වාඩිවෙන්න |
| දසුන්: | සුබ උදෑසනක් වේවා! |
|  | (ලේකම්වරයා ද ආශීර්වාද කරයි.) ලේකම්තුමනි, ඔබ තුමාට ආරාධනාවක් කිරීමටයි ආවේ. මම වැලිගල තැන්න ක්‍රීඩා සමාජයේ (ආරාධනා පත්‍රය පිළිගන්වමින්) |
| ප්‍රාදේශිය ලේකම්: | මම දන්නවා වැලිගලතැන්න ක්‍රීඩා සමාජය ගැන. ඔබේ ක්‍රීඩා සමාජය ප්‍රදේශයේ උද්යෝගයෙන් කටයුතු කරන ක්‍රීඩා සමාජයක්. එවැනි අයට අප උදවු කරන්න ඕනෑ. |
| | ඉතින් මොකක් ද කාරණය? |
| දසුන්: | අපේ ක්‍රීඩා සමාජයේ ත්‍යාග හා සහතික පත්‍ර බෙදා දීමේ උත්සවය ලබන මාසේ 15 වැනිදා. හවස දෙකට යි, උත්සවය සූදානම් කරලා තියෙන්නේ. |
| ප්‍රාදේශීය ලේකම්: | (දිනපොත පෙරළා බලමින්) හා... එදාට විශේෂ රාජකාරියක් යෙදී නැහැ. ඔබේ උත්සවයට මට එන්න පුළුවන්. |
| දසුන්: | ඔබතුමාට බොහෝ ම ස්තුතියි! |

කෙනෙකු අදහස් පළ කරන විට ඊට සංයමයෙන් සවන් දී අවස්ථාව පැමිණි විට ප්‍රතිචාර දැක්වීමත් කථන හා ශ්‍රවණ ක්‍රියාවලිය මගින් අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට හේතු වෙයි.

## ලිඛිත අභ්‍යාස

1. **පහත දැක්වෙන අවස්ථා අලළා සංවාදයක් ගොඩනගන්න.**

   i. ඔබේ පන්ති කාමරයේ පැවැත්වෙන චිත්‍ර ප්‍රදර්ශනය නැරඹීමට විදුහල්පතිතුමාට පැමිණෙන ලෙස ආරාධනා කරන අවස්ථාව

   ii. ළමා ඉතුරුම් ගිණුමක් ආරම්භ කිරීමේ දී බැංකු නිලධාරියකු සමග කතා බහ කරන අවස්ථාව

   iii. ඔබේ පාසලේ අධ්‍යාපන චාරිකාවක් සඳහා බස් රථයක් ලබා ගැනීම සඳහා ව්‍යාපාරික මහතකු සමග කරන කතා බහ

## ප්‍රායෝගික අභ්‍යාස

1. **එකිනෙකා සමග අදහස් හුවමාරුවේ දුර්වලතා කියැවෙන පහත සඳහන් ප්‍රස්තාව පිරුළකට අදාළ කථාවක් ලියන්න.**


   i. කළුවා මාරපන් ගියා වගේ

   ii. හතර බීරි කතාව වගෙයි

   iii. දොම්පෙට යන පාර ඇහුවා වාගේ

2. **සවන් දීමේ දී සිත්හි තබා ගත යුතු කරුණු ඇතුළත් වගුවක් නිර්මාණය කරන්න.**

3. **ඔබ ඉගෙන ගන්නා දහම් පාසලේ ස්වාමීන් වහන්සේ නමක/පූජකවරයකු සමග කෙරෙන දෙබසක් ගොඩනගන්න.**



**සාමාන්‍ය කතා බහ පමණක් නො ව සවන් දීම මගින් දැනුම අධ්‍යාපනය ලබා ගැනීම ද සිදු වෙයි. ලිවීම ප්‍රචලිත නොවූ පැරණි සමාජයේ අධ්‍යාපනය මුළුමනින් ම සවන් දීම මත රඳා පැවතිණි. එදා උගතා හැඳින්වීම සඳහා යෙදුණු ‘බහුශ්‍රැත ’යන්නෙහි අරුත ද ‘බොහෝ ඇසූ’ යන්න යි. අද ද උගතකු හැඳින්වීමට “බොහෝ ඇසූ පිරූ තැන් ඇති” යනුවෙන් ව්‍යවහාර කෙරේ.**